# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2246/12 - 2021 සැප්තැම්බර් මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2021.09.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 වන අධිකාරයවූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ(2) වගන්තිය යටතේ මහරගම නගර සභාවේ උප සභාපති ධූරයේ පුරප්පාඩුව පිරවීම**

මියයාම හේතුකොට ගෙන මහරගම නගර සභාවේ උප සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66ආ(2) වන වගන්තිය යටතේ තනතුර දැරූ උප සභාපති වන රාජපක්ෂ මොහොට්ටිගේ කරෝලිස් අයත් වන්නා වූ අංක 02 දරන ස්වාධීන කණ්ඩායම් නායකට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නා වූ ද, එම මහරගම නගර සභාවේ උප සභාපති පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී ස්වාධීන කණ්ඩායම් නායක විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ගල්කන්ද ආරච්චිගේ සුනිල් පියරත්න නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

මහරගම නගර සභාවේ තේරීම්භාර නිලධාරී, වේවැල්වල හේවගේ රවින්ද්‍ර විජය කුමාර වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය වූ) 66 ආ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ගල්කන්ද ආරච්චිගේ සුනිල් පියරත්න, මහරගම නගර සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. එච්. ආර්. විජය කුමාර,
තේරීම්භාර නිලධාරී,
මහරගම නගර සභාව.

2021 සැප්තැම්බර් මස 23 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කොළඹ.

1A - G 34908 — 30 (2021/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*